# ටයිම්ස් මන්දිරය තුළින් ඇරඹුණු ඩී.බී ධනපාලගේ පුවත්පත් කලාව

මධුරානි අත්තනායක*

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්මාන්තය නගා සිටුවීමට පුරෝගාමී වූ චරිත අතර ඩී.බී ධනපාලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. කුඩා කල සිටම ලේඛන කලාවට උපන් හපන්කම් දක්වූ ඩී.බී ධනපාල ඉන්දියාවේ අලහබාද් විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලැබීමෙන් පසු ලේක්හවුස් ආයතනයේ සේවයට බැඳුණි. ඔහු නිරන්තරයෙන් දේශීයත්වයට මුල් තැන දෙමින් දේශීය පාඨකයා ඉලක්ක කොට ගනිමින් ලිපි ලිවීය. ඔහුට අනන්‍ය භාෂා ශෛලියක් මත හිඳිමින් සිංහල වාග් කෝෂයට නව වචන හඳුන්වා දෙනු ලැබීය. පුවත්පත් කලාවට මහගු සේවයක් කළ ඩී.බී ධනපාලගේ පුවත්පත් කලාව පිළිබඳව සහ එකල සමාජ දේශපාලන පසුබිම ධනපාලගේ පුවත්පත් මගින් විවරණය වන අයුරුත් ලංකාවේ ප්‍රධාන පුවත්පත් බිහි කිරීමට ඔහු පුරෝගාමී වී ඇති අයුරුත් මෙමගින් අධ්‍යයනයට ලක් කර ඇත.

**ලේක් හවුස් ආයතනය සහ ඩී.බී ධනපාල**

ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව ආරම්භ වනනේ ක්‍රිස්තු වර්ෂ 1832 වසරේ මුද්‍රණය කරනු ලැබූ "ද කලම්බු ජර්නල්" පුවත්පතත් සමගයි. ඉන් පසුව සිංහල , දෙමළ ,ඉංග්‍රීසි යන ත්‍රෛයි භාෂාවෙන්ම පුවතපත් පළ විය. නමුත් ලංකාවේ පුවත්පත් මුද්‍රණයේ ප්‍රබෝධයක් දැකගත හැකි වන්නේ ශ්‍රී ලංකාවේ පත්තර මහගෙදර ලෙස හඳුන්වන ලේක් හවුස් ආයතනය ආරම්භ කිරීමත් සමගය. ලේක් හවුස් ආයතනයේ පුවත්පත් අධිරාජ්‍යයක් බිහි කරමින් සිටි ඩී.ආර් විජේවර්ධන මහතා 1930 දශකය වන විට පත්තර ලෝකයේ පමණක් නොව දේශපාලන ලෝකයේද ප්‍රසිද්ධ පුද්ගලයෙකු බවට පත් වෙමින් සිටියේය. එවකට ලංකාවේ පළවූ එකම දිනපතා සිංහල පුවත්පත වූ "දිනමිණ" පත්‍රයේත් එකම ඉරිදා සිංහල පුවත්පත වූ "සිළුමිණ" පුවත්පතේත් අයිතිකරු වූයේ විජේවර්ධන මහතාය. "ඩේලි නිව්ස්" පත්‍රය ලේක්හවුස් ආයතනයේ දිනපතා ඉංග්‍රීසි පුවත්පතයි. එහි කර්තෘ ධූරය දරනු ලැබුවේ හර්බට් හුලුගල්ල මහතාය.

පුවත්පත් කර්තෘ වරයා විසින් පුවත්පත මුද්‍රණය කර බෙදා හරිමින් තමන් විසින්ම ධනය උපයා ගන්නා කර්මාන්තයක් එකල ගොඩනැගී තිබුණි. ඥානාර්ථ ප්‍රදීපය, ස්වදේශ මිත්‍රයා, සිංහල බලය වැනි පුවත්පත් මගින් ආගම ප්‍රචාරය කළේය. දේශපාලන මතවාද ප්‍රචාරය කිරීමේ අරමුණ මුල් කර ගනිමින් සමසමාජය, නව ශක්ති, ජන ශක්ති වැනි පුවත්පත් බිහි විය.(පියදාස, 2009). මෙවැනි කාල සීමාවක ඩී.ආර් විජේවර්ධන එංගලන්තයේ අධ්‍යාපනය ලැබීමෙන් පසු ලංකාවට පැමිණ විමධ්‍යගත කළමනාකරණයක් සහිත කර්තෘ මණ්ඩලයක් බිහි කළේය. ලිවීමට, මූල්‍ය කටයුතු, බෙදා හැරීමට ආදි වශයෙන් වෙන් කරමින් පුවත්පත් කර්මාන්තය ක්‍රමානුකූලව ගොඩනගන ලදි. පුවත්පත් කර්මාන්තයේ ව්‍යාපාරික ප්‍රජාව ඩී.ආර්

* *තාවකාලික කථිකාචාර්ය, ජන සන්නිවේදන අධ්‍යයන අංශය, madhuaththanayaka@gmail.com*

විජේවර්ධන විසින් නිර්මාණය කළේය.මෙවැනි පසුබිමක තිබූ පුවත්පත් කර්මාන්තයට කලාත්මක අගයක් එක් කරමින් පුවත්පත් කලාවක් බිහි කිරීමට පුරෝගාමී වූයේ ඩී.බී ධනපාල විසිනි.

පුවත්පත් කලාවේ දියුණුවට මග කියූ කතුවරයෙක් ලෙස ඩී.බී ධනපාල හැඳින්විය හැකිය. පාසල් කාලයේ පටන්ම ලේඛනයට උපන් හපන්කම් දක් වූ ඔහු වැඩි දුර අධ්‍යාපනය සඳහා ඉන්දියාවේ "අලහබාද්" විශ්වවිද්‍යාලයට ඇතුළු විය. එහිදීද ඉන්දියාවේ ජනප්‍රිය පුවත්පතක් වූ "Leader" පුවත්පතට ද ලිපි ලිව්වේය. මීට අමතරව " ස්ටේටස්මන්" සඟරාවේ සෝදුපත් බලන්නෙකු ලෙස සේවය කළේය.

මේ කාලයේ ඉන්දියාවේ සිට ලංකාවේ පළ වූ "ඩේලිනිව්ස්" පත්‍රයට ලිපි ලිවීය. ඔහුගේ ලිපි ලංකාවේ ඉංග්‍රීසි පුවත්පත් පාඨකයන් අතර අතිශය ජනප්‍රිය විය. ඔහුගේ ලේඛන ශෛලිය විශේෂ විය. මේ නිසා ඩී. ආර් විජේවර්ධන සහ හර්බට් හුලුගල්ල විසින් ඩී.බී ධනපාලගේ විදේශ අධ්‍යාපන කටයුතු වලින් පසු ලංකාවට ගෙන්වාගෙන "ඩේලිනිව්ස්" පත්‍රයේ සේවයෙහි යෙදවීමට තීරණය කළේය. ඒ බව ඩී.බී ධනපාලට දන්වීමෙන් අනතුරුව ඊට කැමැත්ත පළ කර ලංකාවට පැමිණීමත් සමග ඔහු "ඩේලිනිව්ස්" පත්‍රයේ විශේෂාංග කර්තෘ ධූරයට පත්කරනු ලැබීය. පුවත්පතට තිබූ කැමැත්ත නිසා ධනපාල ඉතා උනන්දුවෙන් සතිපතා මාස් පතා නව අංග පුවත්පතට එකතු කරමින් "ජේන්ස්" යන ආරූඪ නාමයෙන් නිතර ලිපි ලිවීය. මේ නාමයෙන් ධනපාල පාඨකයා අතර ජනප්‍රිය විය.

ඩේලි නිවුස් පුවත්පතේ පරිවර්තනයක් ලෙස දිනමිණ පුවත්පත පළවුණි. ධනපාල පුවත්පත තුළින් සිංහල භාෂාවට නව වචන එක් කළේය. අග්‍රාණ්ඩුකාර වරයා යන්නට " ලකිසුරු" ලෙස පුවත්පතේ භාවිත කළේය. සර්වේ ජනරාල් යන්නට "මැනුම්පති" යනුවෙන් භාවිත කළේය.එමෙන්ම නව කලාත්මක අංගයන් පුවත්පතට එක් කිරීමට ඩී.බී ධනපාලට හැකි විය.

පත්‍රයේ දියුණුව උදෙසා කැපවී වැඩ කරන අතරතුර විවිධ පුද්ගලයන් ඔහුට විරුද්ධව නැගී සිටියේය. නමුත් ලේඛනයට තිබූ කැමැත්ත නිසා ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වමින් වසර හතක් ලේක්හවුස් මන්දිරයේ සේවය කළේය. මේ අතරතුර කාලයේ ඩී. ආර් විජේවර්ධන විසින් පත්‍රයේ කර්තෘ මණ්ඩලයට විදේශිකයන් බොහෝ පිරිසක් බඳවා ගත්තේය.මේ නිසා අධිරාජ්‍යවාදී මත ප්‍රචායට පුවත්පත යොදා ගැනුණි. ධනපාල විදෙස් රටක අධ්‍යාපනය ලැබූ අයෙකු වුවද දේශීයත්වයට මුල් තැන දුන් අයෙකි. එම නිසා සුද්දන්ගේ අධිරාජ්‍යවාදී මත සහ ධනපාලගේ දේශීය ජාතික හැඟීම් පිළිබඳව ඇති වූ මතභේදයන් නිසා බොහෝ ගැටලු කාරී තත්ත්වයන් ඇති කළේය. 1939 වසරේ ස්ටුවර්ඩ් නැමති විදේශිකයා සමග ඇති කරගත් උණුසුම් වචන හුවමාරුවකින් පසු ධනපාල මහතාගේ ඉල්ලා අස් වීමේ ලිපිය භාර දී ලේක්හවුස් මන්දිරයෙන් ඉවත් විය.(ලියනගේ, 1972)

## ටයිම්ස් ආයතනය සහ ලංකාදීප පුවත්පත

19 වන සියවසේ යටත් විජිත පාලනය නැගීම සමග ශක්තිමත්ව ගොඩනැගුණු ප්‍රථම සංවිධානාත්මක පුවත්පත් ආයතනය වූයේ කොළඹ කොටුවේ සිලෝන් ටයිම්ස් සමාගමයි. මුළුමනින්ම සාම්ප්‍රදායික ප්‍රභූ පුවත්පත් වල හැඩය හා හරය සහිත වූ ටයිම්ස් පුවත්පත පෙනී සිටියේ පාලකයාගේ හෙවත් යටත්විජිත වාදියාගේ අදහස් වෙනුවෙනි. කොටුවේ ටයිම්ස් කන්තෝරුව කොළඹ ප්‍රසිද්ධ වූයේ එකල හැටියට කොටුවේ පැරණි කොටු තාප්පය ළඟ තිබුණු උස් ගොඩනැගිල්ලක් නිසාම නොවේ. එය අධිරාජ්‍යවාදීන්ගේ තොරතුරු බෙදා හරින සන්නිවේදන ස්ථානයක් ලෙසය.

ටයිම්ස් ආයතනයට සෘජු තරගකාරිත්වය ගොඩ නැගුනේ 20 වන සියවස මුල් භාගයේ දී ලේක්හවුස් ආයතනය ගොඩ නැගීම සමගය. ලේක් හවුස් ආයතනය බිහි වීමට පෙර ටයිම්ස් ආයතනය ලංකාවේ පුවත්පත් මුද්‍රණයේ පුරෝගාමියා විය. කාලයත් සමග ඉංග්‍රීසි ජාතික ව්‍යාපාරිකයින්ගේ දැඩි සාම්ප්‍රදායික ආකල්ප වෙනස් වූයේ පුවත්පත් අයිතිය ඉංග්‍රීසි ව්‍යාපාරිකයන්ගෙන් ලාංකේය ද්‍රවිඩ ව්‍යාපාරිකයින්ට මාරු වීම සමගය.

මෙරට ඉංග්‍රිසි පුවත්පත් ක්ෂේත්‍රයේ ප්‍රධාන ඒකාධිකාරය ඇති කර ගැනීමේ හැකියාව තිබුනේ "Times of Ceylon" පුවත්පතට අමතරව "Evening Times" පුවත්පතටය. "Times of Ceylon" පුවත්පත ආරම්භ කරන ලද්දේ ව්‍යාපාරික අවශ්‍යතා පදනම් කර ගනිමින් 1846 ජූලි 07 වනදාය. මෙම පුවත්පතේ ජනප්‍රියත්වය නිසාම පසු කාලීනව මේ හා සමගාමීව යන පුවත්පතක් ලෙස "Morning Times" පුවත්පත ආරම්භ කළේය. (පියදාස, 2009)

ලේක් හව්ස් ආයතනයෙන් ඉවත් වී ටික කලක් ගත වීමෙන් පසු ධනපාල මහතා ටයිම්ස් ආයතනයට සම්බන්ධ විය. ටයිම්ස් ආයතනය ඉංග්‍රීසි පුවත්පත් මුද්‍රණය කළද ධනපාලගේ චතුර ඉංග්‍රීසි බස එහි සේවය කිරීමට රුකුලක් විය. ධනපාල නිතර දේශීයත්වයට මුල් තැන දුන්නද ලේඛනයට ඇති කැමැත්ත නිසා මෙම පුවත්පතට බැඳුණි.

ඩී.බී ධනපාල මහතා ලේක්හවුස් ආයතනයෙන් ඉවත් වී ටයිම්ස් ආයතනය තුළ සිංහල පුවත්පතක් මුද්‍රණය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමට උත්සාහ ගත්තේය. ටයිම්ස් මන්දිරයේ කළමණාකාර අධ්‍යක්ෂක ධූරය දරූ ටොම් ලින්සන් මහතා සිංහල පුවත්පතක් ඇරඹීම තදින්ම ප්‍රතික්ෂේප කර ඇත. "මගේ මළමිනිය උඩින් මිසක් ටයිම්ස් සමාගමේ සිංහල පත්‍රයක් ගහන්න දෙන්නෙ නෑ" යනුවෙන් ටොම් ලින්සන් මහතා අවස්ථා කිහිපයකම කියා තිබුණි (ලියනගේ,1972). නමුත් මේ වන විට ටයිම්ස් ආයතනයේ පාලන බලය ආන්දෝලනාත්මක විය. මේ අතරතුර කාලයේ දී 'සංගරපිල්ලේ' නැමති ද්‍රවිඩ ජාතිකයෙකු විසින් විදේශ ආධිපත්‍යට නතුව තිබූ ටයිම්ස් ආයතනය මිලදී ගත්තේය. මේ අයුරින් ඉතා ඉක්මනින් ටයිම්ස් හිමිකාරිත්වය වෙනස් වීම නිසා සිංහල පුවත් පත් ඇරඹීමට තිබූ ධනපාලගේ අදහසට සංගරපිල්ලේ විසින් අනුමැතිය ලබා දුන්නේය.

කෙසේ වෙතත් ටයිම්ස් පුවත්පත් ආයතනය මෙරට සංවර්ධනයට බලපෑමක් ඇති කළේ ඉංග්‍රීසි පුවත්පත් වලට වඩා සිංහල පුවත්පත් බිහි වීම සමගය. ඒ ගෞරවය හිමි විය යුත්තේ

ධනපාලටය. නිදහසින් පසු සමාජයේ ඇති වෙමින් තිබූ ප්‍රතිසංස්කරණ මුල් කරගනිමින් ඉංග්‍රීසි පුවත්පත් කලාව බිඳ වැටෙන්නට විය. මෙම නව ප්‍රතිසංස්කරණ වලට ටයිම්ස් ආයතනයේ සිංහල පුවත්පත් මගින් ප්‍රබල බලපෑමක් එල්ල විය. ඉංග්‍රීසි පුවත්පත් උදෙසා කැපවීමෙන් කටයුතු කළ ටයිම්ස් ආයතනයේ සමාජ බලපෑම් වඩාත් උත්සන්න කළේ 1947 වසරේ "ලංකාදීප" පුවත්පත බිහි වීම සමගය. මේ රටේ පත්‍ර කලා ඉතිහාසයේ මහා විප්ලවය ආරම්භ කරන ලද්දේ ඩී.බී ධනපාල විසින් 1947 ඔක්තොම්බර් 29 වනදා ලංකාදීප පත්‍රය ආරම්භ කිරීම මගිනි. මෙය දිනපතා සවස ටැබ්ලොයිඩ් පුවත්පතක් ලෙස පළ විය. ආරම්භක කර්තෘ ලෙස කටයුතු කළ ජුලියස් ලැනරෝල් මහතාගේ අභාවයෙන් පසු ඩී.බී ධනපාල මහතා ප්‍රධන කර්තෘ ධූරය හෙබවීය. ධනපාල ලංකාදීප පුවත්පත ඔස්සේ නාමධාරී පුවත්පත් කාලවේදීන් විශාල පිරිසක් රටට හඳුන්වා දීමට සමත් විය. මහානාම දිසානායක, ප්‍රින්ස් ගුණසේකර, නිමල් කරුණාතිලක, ඩී.බී ද ලැනරෝල්, පෙරමුණේ තිලක, චන්ද්‍රරත්න මානවසිංහ, දීගොඩ පියදාස, කරුණාසේන ජයලත් යනාදීන් ඒ අතර වෙයි. (අයිවන්, 2015)

1947 දී ටයිම්ස් ආයතනයේ ඩී. බී ධනපාල මහතාගේ හා ජුලියස් ලැනරෝල් මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ ලංකාදීප පුවත්පත එතෙක් ලේක් හවුස් ආයතනයෙන් බිහි වූ සිංහල පුවත්පත්වලට තරඟයක් දීමට තරම් ප්‍රබල වූ පුවත්පතකි. ලංකාදීප පුවත්පත ලේක්හවුස් ආයතනයේ දිනමිණ පුවත්පතට අභියෝගයක් එල්ල කරමින් දේශීය සම්ප්‍රදාය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. "සඟ -වෙද -ගුරු -ගොවි -කම්කරු" යන පඤ්චමහා බලවේග යටතේ ජනතාව ගොනු කරමින් නව චින්තනයක් ඔස්සේ ඔවුන් මෙහෙයවීමට දැරූ උත්සහය එම පුවත්පතින් මුල් කාලයේ දැකගත හැකි විය. ලංකාදීප පුවත්පත මුලු මනින්ම දේශීයත්වය අගය කළේය. සිංහල පාඨක අවශ්‍යතා ඉටු කිරීමට සමත් වූ පුවත්පතකි. එමෙන්ම ලංකාවේ එවකට පැවති දේශපාලන පසුබිම විවරණය වූ පුවත්පතකි.

### 1950 දශකයේ දේශපාලන ව්‍යාපාරය

1950 දශකයේ එක්සත් ජාතික පක්ෂ විරෝධී දේශපාලන ව්‍යාපාරයක් ගෙන යාමට ඩී.බී ධනපාල යොදා ගනු ලැබුවේ ලංකාදීප පත්‍රයයි. ආණ්ඩු විරෝධී බලවේග වලට ලංකාදීපයෙන් විශාල ප්‍රචාරයක් හිමි විය. 1956 හර්තාලයෙන් පසු නොබෝ දිනකින් ඩඩ්ලි සේනානායක මහතා අගමැති කමින් ඉල්ලා අස් විය. සර් ජෝන් කොතලාවල අගමැති ධූරයට පත් වීමෙන් පසු ඔහුට විරුද්ධව පුළුල් ප්‍රචාර ගෙන ගියේ ලංකාදීප පුවත්පතෙනි. කොතලාවල විරෝධී බලවේගය වඩාත් ප්‍රබල වූයේ "වස්සා පුළුස්සාගෙන කෑමේ" සිද්ධියෙනි. අගමැති ජෝන් කොතලාවල "බාබර්ක්‍යූ" නමින් හැඳින්වෙන වස්සෙකු පුළුස්සා කෑමේ චාරිත්‍රයට අනුව එයට සහභාගීවීමේ සිද්ධිය මුල් කර ගනිමින් ලංකාදීපයේ ලිපි පළ කළේය. කෙසේ නමුත් 1956 මහමැතිවරණ සමයේ බණ්ඩාරණායක මහතාගේ නායකත්වයෙන් පිහිටවු මහජන එක්සත් පෙරමුණ පක්ෂයට පක්ෂපාතී ලෙස ධනපාල ලිපි ලිවුවේය .

කාලීනව ටයිම්ස් සමාගමේ පාලක පක්ෂය වෙනස් වීමත් නොයෙකුත් දේශපාලන මැදිහත්වීම් බහුල වීමත් නිසා ඩී.බී ධනපාල ටයිම්ස් සමාගමෙන් ඉවත්වීමට තීරණය කළේය. තමාගේ ස්වාධීනත්වය තව දුරටත් රැකගනිමින් කටයුතු කිරීමට නොහැකි බව වටහාගත් ඔහු 1960 දශකයේ අග භාගයේ ටයිම්ස් මන්දිරයෙන් ඉවත්ව ගියේය. ටික කලක් ගතවෙත්ම බොරැල්ල වෝඩ් පෙදෙසේ නව පුවත්පත් ආයතනයක් ආරම්භ කළේය. එම පුවත්පත සතිපතා පත්‍රයක් වූ අතර "දිවයින" නමින් පළ විය.

1960 දශකයේ බිහිවූ රසවාහිනී සඟරාව ලංකාවේ විද්වත් ප්‍රජාවගේ නිර්මාණාත්මක මෙන්ම නැවුම් අදහස් සහිත ලිපි ඇතුළත් වූ නිසා පුවත්පත් පාඨකයා අතර බෙහෙවින් ජනප්‍රිය සඟරාවක් විය. මාර්ටින් වික්‍රමසිංහ, සෙනරත් පරණවිතාන, සිරිසීවලී හිමි, හික්කඩුවේ පඤ්ඤාසාර හිමි ආදී උගතුන් සහ කලාකරුවන් ගේ අදහස් වලින් රසවාහිනී සඟරාව පෝෂණය විය.

**දවස පුවත්පත් ආයතනය සහ ධනපාල**

ලේක් හවුස්, ටයිම්ස් වැනි පුවත්පත් ආයතන වලට අභියෝගයක් එල්ල කරමින් ආරම්භ වූ සීමා සහිත ස්වාධීන පත්‍රකලා සමාගම (දවස) නිදහසින් පසු මෙරට බිහි වූ ප්‍රධාන පෙළේ පුවත්පත් සමාගමකි. පොත් ප්‍රකාශනය, බෙදා හැරීම හා අලෙවි කිරීමේ නිරතව සිටි සුප්‍රකට ගුණසේන සහ සමාගම පුවත්පත් ප්‍රකාශනය සඳහා පොළඹවාගනු ලැබූයේ ඩී.බී ධනපාල විසිනි. ධනපාලගේ මූලිකත්වයෙන් දවස පුවත්පතේ මංගල කලාපය 1961 අගෝස්තු 14 වනදා සිදු විය.

දවස ආයතනයෙන් රටේ සෑම වයස් මට්ටමකම පාඨකයා නියෝජනය වන පරිදි පුවත්පත් මුද්‍රණය කළේය. ළමයින් සඳහා 'ටිකිරි' , නක්ෂත්‍රය සඳහා 'ඉරණම', කෙටිකතා සඳහා 'රසකතා',කවි සඳහා 'ගීතාංජලී' ආදී වශයෙන් පුවත් පත් බිහි කරමින් පුවත්පත් උප සංස්කෘතියක් නිර්මාණය කළේ ඩී.බී ධනපාල නම් පුවත්පත් කලාවේදියා විසිනි.

දවස කර්තෘ මණ්ඩලයද විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර නියෝජනය කරන රටේ උගත් පිරිසකි. ගුණදාස ලියනගේ, සිරිවිමල,රෝහණ ගමගේ, ශ්‍රියා රත්නකාර, සුමනදාස අමරසිංහ ආදී කවීන් කලාකරුවන් දවස පුවත්පත පෝෂණය කිරීමට මුල් විය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පුවත්පතක් මගින් ප්‍රදේශීය වාර්තාකරුවන් ඇගයීමට ලක් වූයේ දවස පුවත්පත මගිනි. පුවත්පතේ සඳහන් වන ලිපි ලියූ වාර්තාකරුවා ප්‍රදේශීය වාර්තාකරුවෙකු නම් ලිපියට පහළින් 'ප්‍රදේශීය ලේඛක (නම) විසිනි' යනුවෙන්ද මාණ්ඩලික වාර්තාකරුවෙකු නම් 'මාණ්ඩලික ලේඛක (නම) විසිනි' යනුවෙන් පුවත්පතේ සඳහන් වුණි. මෙම ක්‍රමවේදය පුවත්පත් තුළට මුලින්ම ගෙන ආවේ ඩී.බී ධනපාල මහතාය.

දවස පුවත්පත ආරම්භයේ සිටම විවිධ දේශපාලන බලපෑම් දක්නට ලැබුනේය. පුවත්පත් ප්‍රදේශ වලට බෙදන විට ඊට මිනිත්තු කිහිපයකින් ඒවා එකතු කරගෙන ගොස් ගිණි තැබූ අවස්ථා තිබුණේය. නමුත් මේ කිසිදු බලවේගයකට බිය නොවී දවස පුවත්පත් ආයතනය පවත්වාගෙන ගියේය. දවස ආයතනය යනු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් මෙන්ම

විවිධ විශේෂාංග පුවත්පත් සඟරා පළ කරමින් මෙරට පුවත්පත් කලාව තුළ නමක් දිනා සිටි ආයතනයකි. දවස ආයතනය ආණ්ඩු විරෝධී බලවේගයකි. බලයේ සිටි රජය සමග දවස පුවත්පත් ආයතනයේ ගැටුම ආරම්භ වන්නේ ව්‍යාපාරික උවමනාවන් හා රජය මගින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ මතය. දවස පුවත්පත් ආයතනයේ හැසිරීම පිළිබඳව පුවත්පත් කොමිසමේ දැඩි අවධානයක් යොමු වී තිබුණි. එහි අවසාන වාර්තාව අනුව දවස මුල් හිමිකාරිත්වය සීමා කිරීමට නිර්දේශ ඉදිරිපත් කෙරුණි.

1970 දශකයේ දවසට එරෙහි වාරණ ක්‍රියාවලියට ආරම්භය සපයන්නේ සමසමාජ පක්ෂය දවස ආයතනය තුළ වෘත්තීය සමිතියක් ආරම්භ කිරීමට ගත් උත්සහයත් සමගිනි. ගුණසේන සමාගමේ ප්‍රධානියා වන සේපාල ගුණසේනගෙන් වෘත්තීය සමිති වලට කිසිදු අනුබලයක් නොලැබුණි. පාලනය කළ නොහැකි වෘත්තීය සමිති කටයුතු අවසන් කිරීම අරමුණු කරගනිමින් 1970 නොවැම්බර් 03 දින සියලු සේවකයින් ඉවත් කරමින් දවස ආයතනය වසා දමා සත් දිනකින් නැවත විවෘත කරනු ලැබීය. දවස පුවත්පත් ආයතනය විපක්ෂයේ කටයුතු වලට සහය දැක්වීම රජය විවිධ උපක්‍රම යොදා ගනිමින් දවස පුවත්පත් ආයතනයේ ක්‍රියාකාරිත්වයට බාධා පැනවීය. එහි එක් පියවරක් වූයේ හදිසි නීතිය යොදා ගනිමින් දවස ආයතනයේ ගබඩා කර තිබූ මුද්‍රණ කඩදාසි ටොන් දහසක් රජයට පවරා ගැනීමයි. දවස ආයතනයට සීල් තැබීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ 1974 අප්‍රේල් 19 වනදාය. 1977 පෙබරවාරි 16 වනදා නැවත එම සීල් තැබීම ඉවත් විය.(රූපසිංහ, 2009)

කෙසේ නමුත් ලංකාදීප පුවත්පතට වඩා වෙනස් මුහුණු වරකින් දවස පුවත්පත මුද්‍රණය විය. පසු කාලීනව "සවස" නමින් පුවත්පතක්ද ඉන් පසු ක්‍රමයෙන් 'සන්' 'ස්ටාර්' 'Weekend' වැනි ඉංග්‍රීසි පුවත්පත් ද 'දිනපති' , 'වාරමංජරී' වැනි දෙමළ පුවත්පත් ද ආරම්භ විය. 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයේ සැබෑ ස්වරූපය මහජනයා වෙත ගෙන ඒම දවස ආයතනයෙන් සිදු විය. එම නිසා එකල දවස පුවත්පත උණු කැවුම් මෙන් විකිණෙන්නට විය. කෙසේ නමුත් පසු කාලීනව භෞතික සම්පත් ප්‍රමාණවත් නොමැති වීම නිසා දවස පුවත්පත් ආයතනය වසා තැබීමට සිදු විය.

**නිගමනය**

ඩී. ආර් විජේවර්ධනගේ පුවත්පත් කර්මාන්තයට නව කලාවක් එක් කරමින් පුවත්පත් කර්මාන්තයට නිර්මාණාත්මක ශෛලයක් එක් කළ ඩී.බී ධනපාල පුවත්පත් කලාවට පිවිසුණු අයුරු මෙහි මූලිකව අසහස් දක්වා එකළ සමාජ දේශපාලන පසුබිම ලංකාවේ ප්‍රධාන පුවත්පත් බිහි කිරීමට ඔහු පුරෝගාමී වී ඇති අයුරුත් මෙමගින් අධ්‍යයනයට ලක් කර ඇත. මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි කරුණු කිහිපයකි. ලංකාවේ පුවත්පත් කර්මාන්තය ඩී.ආර් විජේවර්ධන විසින් බිහි කළ අතර පුවත්පත් කලාව බිහි වූයේ ඩී.බී ධනපාලගේ මූලිකත්වයෙනි. සියලුම වයස් මට්ටම් වල පාඨක ප්‍රජාව නියෝජනය වන පරිදි විවිධ පුවත්පත් මුද්‍රණය කළේය. එමෙන්ම කලාව, ආගම, නක්ෂත්‍රය වැනි විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි පුවත්පත් මුද්‍රණය කළේය.

ඩී.බී ධනපාල මහතා මෙතෙක් ලංකාවේ බිහිවූ විශිෂ්ටතම පුවත්පත් කලාවේදියෙකු බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. පත්‍ර කලාව ආරම්භක යුගයේ සිට තමන්ට අනන්‍ය වූ මතවාදයක හිඳිමින් කටයුතු කිරීමත් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් විරුද්ධවාදියා දැඩි සේ හෙලා දැකීමත් නිසා පත්‍රකලා ජීවිතය තුළ ඔහුට විවිධ අභියෝගයන්ට තනිව මුහුණ පාන්නට සිදු විය. නමුත් ඒ කිසිදු දෙයකින් පසුබට නොවූ ධනපාල නම් මහා පත්‍ර කලාවේදියා ලාංකේය අනන්‍යතාවය පෙරටු කොට ගනිමින් සිංහල පාඨකයා වෙත මුල් තැන ලබා දෙමින් පත්‍ර කලාවේ නිරත විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අයිවන්, වික්ටර් (2015), *අයාලේ යන ජනමාධ්‍ය*, රාවය පබ්ලිෂර්ස්, මහරගම.

පියදාස, රෝහණ ලක්ෂ්මන් (2009), *පත්තර සිහිවටන සටහන්*, ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ.

බාලගේ, ධනපාල (2009), *සිංහල පුවත්පත් හා ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ දේශපාලන භාවිතය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රාජපක්ෂ, චන්ද්‍රසිරි (2013), "දේශීය ලේඛන ඉතිහාසය සහ වැදගත් සංධිස්ථාන", *මාධ්‍ය විමර්ශී 7*, නිහාල් ප්‍රින්ටර්ස්, කුරුණෑගල.

රූපසිංහ, විජයානන්ද (2009), "ලාංකීය පුවත්පත් කලාව හා කර්මාන්තය", *මාධ්‍ය සමීක්ෂා 2*, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, කොළඹ.

ලියනගේ, ගුණදාස (1972), *ඩී.බී ධනපාලගේ විප්ලවය*, දීපානී මුද්‍රණ ශිල්පීයෝ, නුගේගොඩ.